DOI : 10.31357/fhssmst.2009.00652

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන ශ්‍රී ලාංකික කාන්තාවන් එයට විසඳුම් වශයෙන් යොදාගන්නා උපාය මාර්ග පිළිබඳ අධ්‍යයනයක්.

(රුවන්වැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ඇසුරින්)

කවුඩු ගමගේ කුමාරි දිපිකා රත්නප්‍රිය.

GS / SS / 1570 / 2002

ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි පරිකෂණය සඳහා සමාජවිද්‍යා විෂයය යටතේ ඉදිරිපත් කරන පරයේෂණ නිබන්ධය.

# කර්තෘ

මෙම පර්යේෂණ නිබන්ධය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතාගේ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුරුද්ධිකා බුද්ධදාස මහත්මියගේ මාර්ගෝපදේශකත්වය යටතේ සම්පාදනය කරන ලදි. මෙහි අන්තර්ගත කිසිවක් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලදද්දක් නොවන බව සහතික කරමි.

[signature]

අත්සන.

(කවුඩු ගමගේ කුමාරි දීපිකා රත්නප්‍රිය).

දිනය...23/04/2009...

## උපදේශක වරයාගේ සහතිකය.

ශාස්ත්‍රපති සමාජවිද්‍යා උපාධිය සම්පූර්ණ කිරීම සඳහා කේ . පී. කුමාරි දිපිකා රත්නප්‍රිය විසින් ඉදිරිපත් කරන මෙම නිබන්ධය මාගේ අධීක්ෂණය යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බව තවදුරටත් සහතික කරමි.

........................

1.අත්සන.

(ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර)

Dr. Praneeth Abhayasundere
Head,
Department of Sociology Anthropology
University of Sri Jayawardenepura
Nugegoda.

........................

2.අත්සන.

(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනුරුද්ධිකා බුද්ධදාස)

සටහන
පරීක්ෂකවරුන් ඉදිරිපත් කළ සුළු සංශෝධන
සකසා ඇති බැව් මින් සහතික කරමි.

2009-5-21

## ස්තුතිය.

ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූ කාන්තාවන් පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනයක යෙදෙමින් ඔවුන් එවැනි තත්වයන්ගෙන් මිදීම සඳහා යොදාගන්නා උපාය මාර්ගත්, ඒවා කොතෙක්දුරට එම ගැටළු විසඳාගැනීම සඳහා උපකාරි වූයේද යන්නත්, අරමුණු කොටගෙන මෙම මෙම පර්යේෂණ ග්‍රන්ථය ලියා ඇත. කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වර්තමානයේ ජනසමාජය තුළ ප්‍රබල කතාබහට ලක්වූ මාතෘකාවක් වන බැවින් මෙම පර්යේෂණය කාලින වැදගත්කමකින් යුක්ත වේ. මෙම පර්යේෂණය කරගෙන යාමේදි මුලසිටම උපදෙස් ලබාදුන් මහාචාර්ය ටෙනිසන් පෙරේරා මහතාටත්, අධ්‍යයනාංශ ප්‍රධාන හා උපදේශක ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහතාටත්, උපදේශිකා අනුරුද්ධිකා බද්ධදාස මහත්මියටත්, අවශ්‍ය අවසථාවලදි විෂය කරුණු පහදා දුන් ආචාර්ය මණ්ඩලයේ සෙසු මහත්ම මහත්මින්ටත් අවශ්‍ය මුලාශ්‍ර ලබාදුන් සැමටත් කෘතඥතාවය පල කරමි.

# පටුන


**පිටු අංකය**

- පටුන. I- III
- වගු ප්‍රස්තාර සටහන්. IV -VI
- සංක්ෂිප්තය. 1-2
- පළමුවැනි පරිච්ඡේදය. 3-16

  හැඳින්වීම හා ක්‍රමවේදය.

  1.1 හැඳින්වීම.

  1.2 අධ්‍යයනයේ අරමුණු

  1.3 අධ්‍යයනයේ වැදගත්කම.

  1.4 මූලාශ්‍ර හා ක්‍රමවේදය.

  1.5 අධ්‍යයනයේ සීමා හා ගැටළු.

  1.6 පරිච්ඡේදකරණය.

- දෙවැනි පරිච්ඡේදය. 28-47

  ප්‍රචණ්ඩත්වය පිළිබඳ හැඳින්වීම හා අර්ථ නිරූපණය.

- තුන්වැනි පරිච්ඡේදය. 48-97

  කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය එහි විවිධ ස්වරූපයන් හා කාලීන ප්‍රවණතා.

- සිව්වැනි පරිච්ඡේදය. 97-142

  ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වල ස්වභාවය ගොදුරුවීම සඳහා බලපාන ලද හේතු සාධක සහ මුහුණ දෙන ගැටළු.

- පස්වැනි පරිච්ඡේදය. 142-162

  කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් වැළකීම සඳහා

  යොදා ගන්නා උපායමාර්ග.
- නිගමන හා යෝජනා 163-169
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. 170-176
- උප ග්‍රන්ථය 1
- උප ග්‍රන්ථය 11

# පටුන


පිටු අංකය

1. පළමුවැනි පරිච්ඡේදය - හැඳින්වීම හා ක්‍රමවේදය. 3-16
2. දෙවැනි පරිච්ඡේදය - ප්‍රචණ්ඩත්වය පිළිබඳ හැඳින්වීම හා අර්ථ නිරූපණය..
   2.1 ප්‍රචණ්ඩත්වය අර්ථ නිරූපණය. 28-35
   2.2 ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය හා එහි වර්ගීකරණයන්. 36-47

3. තුන්වැනි පරිච්ඡේදය
   කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය එහි විවිධ ස්වරූපයන් හා කාලීන ප්‍රවණතා.
   3.1 කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හැඳින්වීම. 48-61
   3.2 ප්‍රජාව ඇසුරෙහි සිදුවන කාන්තාවන්ට එරෙහි හිංසා ක්‍රියා. 62-71
   3.3 රජය වගකිවයුතු ප්‍රචණ්ඩ ක්‍රියා. 72-78
   3.4 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය. 79-96

4. සිව්වැනි පරිච්ඡේදය.
   ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එහෙර ගෘහස්ථ ප්‍රචණ්ඩක්‍රියා වල ස්වභාවය, ගොදුරුවීම සඳහා බලපාන ලද හේතු සාධක සහ මුහුණ දෙන ගැටළු.
   4.1 ක්ෂේත්‍රය ආශ්‍රිතව ගෘහස්ථා ප්‍රචණ්ඩ ක්‍රියා වල ස්වභාවය. 97-116
   4.2 කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම සඳහා බලපාන හේතු සාධක. 117-134
   4.3 ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ගොදුරුවන කාන්තාවන් මුහුණ දෙන ගැටළු. 135-141
5. පස්වැනි පරිච්ඡේදය. 142-162
   කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් වැළකිම සඳහා යොදා ගන්නා උපායමාර්ග.

6. නිගමන හා යෝජනා 163-169
7. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. 170-176
8. උප ග්‍රන්ථය-1
9. උප ග්‍රන්ථය-11

## සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර සටහන්.


| සංඛ්‍යා වගු | | | පිටු අංක |
|---|---|---|---|
| 1. | වගු අංක 3.1.1. | ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය. (1985-1991) | 51 |
| 2 | වගු අංක 3.1.2. | අවුරුදු 18ට වැඩි ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය. (1999-2002) | 52 |
| 3 | වගු අංක 3.1.3. | ස්ත්‍රීන්ට එරෙහිව සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා. (2003-2005) | 53 |
| 4 | වගු අංක 3.1.4. | ස්ත්‍රී දූෂණ සිදුවීම්. (1982-2002 ) | 53 |
| 5 | වගු අංක 3.1.5. | ස්ත්‍රී දූෂණ(2003-2005). | 54 |
| 6 | වගු අංක 3.2.2 | කාන්තාවන්ට එරෙහිව සිදුවූ මිනිමැරීම්.(1996-2001) | 63 |
| 7 | වගු අංක 3.2.3 | කාන්තාවන්ට එරෙහිව සිදුවූ මිනිමැරුම් - වයස් මට්ටම අනුව. | 64 |
| 8 | වගු අංක 3.2.4 | ලෝකයේ විවිධ රටවල් වල සිදුවූ ගබ්සාවන්-1994 | 66 |
| 9 | වගු අංක 3.2.5 | ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී දූෂණ පිළිබඳ සංඛ්‍යා දත්ත. | 67 |
| 10 | වගු අංක 3.4.B.1. | සංක්‍රමණික කාන්තාවන්ට කාන්තාවන්ට එරෙහි හිංසා ක්‍රියා. | 76 |
| 11 | වගු අංක 3.4. G.1. | ඉන්දියාවේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය | 88 |
| 12 | වගු අංක 4.1.1. | කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ පුද්ගලයින් | 98 |
| 13 | වගු අංක 4.1.2. | කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ ස්වභාවය. | 102 |
| 14 | වගු අංක 4.1.3. | කාන්තාවන් විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට දක්වන ලද ප්‍රතිචාර. | 110 |

| | | | |
|---|---|---|---|
| 15 | වගු අංක 4.2.1. | කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම සඳහා බලපාන ලද හේතු සාධක. | 117 |
| 16 | වගු අංක 4.2.2. | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පවතින පවුල්වල ආදායම් තත්ත්වය. | 120 |
| 17 | වගු අංක 4.2.3. | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම | 127 |
| 18 | වගු අංක 5.1 | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් වැළකීම සඳහා කාන්තාවන් අනුගමනය කළ උපාය මාර්ග. | 143 |

| ප්‍රස්තාර සටහන් | | පිටු අංක |
|---|---|---|
| 19. 2.1.1 සටහන | කාන්තාවන්ට එරෙහි ප්‍රජාව තුළ සිදුවන හිංසා ක්‍රියා. | 62 |
| 20. 3.3.1 සටහන | රජය වගකිවයුතු ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ සටහන. | 74 |
| 21. 3.4.C 1 සටහන | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වර්ගීකරණය. | 84 |
| 22. 3.4.F1 සටහන | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ පොදු ස්වරූපය. | 86 |
| 23. 4.1.a ප්‍රස්තාරය | කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ පුද්ගලයින් | 99 |
| 24. 4.1.b ප්‍රස්තාරය | කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කළ ස්වභාවය. | 103 |
| 25. 4.1.c ප්‍රස්තාරය | කාන්තාවන් විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට දක්වන ලද ප්‍රතිචාර. | 111 |
| 26. 4.2.a ප්‍රස්තාරය | කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම සඳහා බලපාන ලද හේතු සාධක. | 118 |
| 27. 4.2.b ප්‍රස්තාරය | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පවතින පවුල්වල ආදායම් තත්ත්වය. | 121 |
| 28. 4.2.c ප්‍රස්තාරය | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම. | 128 |

# සංක්ෂිප්තය.

වත්මන් සමාජය තුළ ප්‍රබල වශයෙන් කතා බහට ලක්වී ඇති කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඉතා කෲර හා අමානුෂික අත්දැකිමකි. අතීත ජනසමාජය තුළ කාන්තාවට ගෞරවණීය තත්ත්වයක් හිමි වුවද, සමාජය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ක්‍රමයෙන් වර්ධනය වන තත්ත්වයක් හඳුනාගත හැකිය.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩක්‍රියා අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වර්තමානයේ ඉතා පුළුල් ලෙස සමාජය පුරා පැතිරී පවතී. කාන්තාවන් තම ගෘහය තුළ දී ප්‍රචණ්ඩකාරී අත්දැකිම් වලට ගොදුරුවීම ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ගොඩනැගුණු හිංසා සහගත ක්‍රියාවක් ලෙස එය සැලකේ. සමහර කාන්තාවන් සම්බන්ධයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එදිනෙදා ජිවිතයේ සාමාන්‍ය අත්දැකිමක් බවට පත් වී ඇත. ස්වාමිපුරුෂයාගේ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන සමහර කාන්තාවෝ තමන් හිංසාවකට ගොදුරු වී ඇති බව නොසිතති. ඔවුන් සිතන්නේ එය පවුල තුළ පැවතිය යුතු තත්ත්වයක් බවයි. එසේම ජිවිත අවුල් සහගත තත්ත්වයට පත්කර ගත් කාන්තාවෝ ද අප සමාජයේ වෙති. මෙසේ කාන්තාවෝ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීම නිසා කායිකව මෙන්ම මානසිකවද පිඩාවට ලක්වෙති. කාන්තාවන් සම්බන්ධයෙන් මෙම තත්ත්වය ඉතා කණගාටුදායකය. පවුල තුළ අතිශය වැදගත් කාර්යභාරයක් ඉටුකරන කාන්තාවගේ සේවය මිල කළ නොහැකිය. ජිවිත කාලය පුරාම ඇය පවුල වෙනුවෙන් වෙහෙසෙයි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන කාන්තාවන් කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද පිරිහිම නිසා ඔවුන්ට නිවසේ වැඩ කටුයතු නිසියාකාරව කළ නොහැකි වනු ඇත. ඔවුන්ගේ පවුල් සංස්ථාව දෙදරා යාමට ලක්වන අතර දරුවන් ද මෙහි බලපෑමට හසුවෙති.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් මිදිම සඳහා කාන්තාවෝ විවිධ උපාය මාර්ග අනුගමනය කරති. ඔවුන් ලබන කායික පිඩනයන්ගෙන් මිදිම සඳහාත්, මානසික සහනය උදෙසාත් මෙසේ විසඳුම් සෙවීම ඉහළ මට්ටමක පවතී. මෙම විසඳුම් මාර්ග වලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනිමේ අරමුණින් එසේ යොමු වුවද, එය සාර්ථක නොවන අවස්ථා ද පවතී.

2005 වර්ෂයේදී ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහිව පාර්ලිමේන්තුවේ පනතක් සම්මත වී ඇත. එමඟින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එල්ල කරන්නාට විරුද්ධව උසාවියේ නඩු පැවරීමේ හැකියාව ඇත. එයද කාන්තාවන්ට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් මිදීම සඳහා යොමු විය හැකි එක් උපාය මාර්ගයකි.

මෙසේ විවිධ විසඳුම් සොයන කාන්තාවන් විවිධ දුෂ්කරතා, ගැටළු වලට මුහුණ දෙති. සමහර කාන්තාවෝ ක්ෂණික ක්‍රියාමාර්ග අනුගමනය කරති. කාන්තාවන්ට පිහිටවීම උදෙසා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් නොයෙකුත් සේවා සැපයීම දක්නට ලැබේ. වත්මන් සමාජයේ ප්‍රබල අවධානයක් යොමු වී ඇති පැතිකඩක් වශයෙන් සලකා, කාන්තාවන් විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට විසඳුම් ලෙස යොදාගන්නා ක්‍රමෝපායන් පිළිබඳ මෙම අධ්‍යයනයෙන් විමසීමට ලක්කර තිබේ.

# පළමුවැනි පරිච්ඡේදය.

# 1. හැඳින්වීම.

## 1.1 හැඳින්වීම.

"කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා ඊට විසඳුම් වශයෙන් යොදා ගන්නා උපාය මාර්ග පිළිබඳ අධ්‍යයනයක්" යන මැයෙන් සිදුකරන ලද අධ්‍යයනය සඳහා පාදක කරගන්නා ලද්දේ ශ්‍රී ලාංකික කාන්තාවන්ය.

ප්‍රචණ්ඩත්වය, ලෝකය පුරා පැතිර පවත්නා ඉතා කෲර වූ හා අමානුෂික සංසිද්ධියක් වශයෙන් හඳුනා ගැනීමේදී ඒ තුළ වඩාත් ප්‍රබල ලෙස කතා බහට ලක්වූ පැතිකඩක් වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයයි. එහිදී වඩාත් සැලකිල්ලට භාජනය කළ යුතු අවස්ථාවක් වශයෙන් කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හඳුනාගත හැකිය. පවුල වෙනුවෙන් සුවිශාල කාර්යභාරයක් ඉටුකරන කාන්තාව පවුල තුළදීම විවිධාකාරයේ හිංසා පීඩාවලට ගොදුරුවීම ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. පවුලේ සාමාජිකයකු විසින් කාන්තාව පාලනය කිරීම හෝ ඉහළින් සිටීම සඳහා ශාරීරික, ලිංගික චිත්තවේගී මානසික, සමාජීය, ආර්ථික වශයෙන් හිංසනයට ගොදුරු කරගැනීම කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසනය ලෙස හඳුනාගත හැකිය. පවුල තුළ මෙසේ ගෘහස්ථ හිංසනයට ගොදුරුවන කාන්තාව මවක්, දියණියක්, බිරිඳ හෝ නැගණිය විය හැකිය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පවුල තුළ උද්ගත වීම හා කාන්තාව එහි ගොදුරු බවට පත්වීමේදී එය පවුලේ ඒකාබද්ධතාවය බිඳ වැටමට හේතුවේ.

එසේම විවාහ සංස්ථාව බිඳවැටීම කෙරෙහිත් දරුවන් කෙරෙහිත් බල පැවැත්වේ. එබැවින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන කාන්තාවෝ ඉන් ලබන ශාරීරික, මානසික හිංසනයට අමතරව තවත් ගැටළු රැසකට මුහුණ දෙති.

කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ අවස්ථා පිළිබඳ අතීත ජනසමාජ වලින් ඉඳහිට තොරතුරු අසන්නට ලැබුණද, අතීත ජනසමාජය තුළ කාන්තාවට විශාල ගරුත්වයක් හිමිවිය. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ මව් දෙවඟන පිදීම තුලින් එදා අර්ථවත් කළේ කාන්තාවට ඇති ගරුත්වයයි. එපමණක් නොව එදා පිතෘ මූලික ජනසමාජ මෙන්ම මාතෘ මූලික ජනසමාජ ද ක්‍රියාත්මක විය. මේ ඇසුරින් එදා ජනසමාජයේ කාන්තාවට හිමිකර දි